# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 8,445—1939ක්වූ අප්‍රෙල් මස 13 වෙනි දිනවූ බෘහස්පතින්ද.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අකුරැස්සේ යන ගමේ පිහිටි සොහොන්ලය විශාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ සරහිතබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමිනම්:—

අවසාන ගම් සිතියම් අංක. 179 අතිරේක E. ගම—අකුරැස්ස.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 186 | මහකුරුදුවත්ත හෝ ගොත් කුරුදුවත්ත | අවුරුදු 50ක් පමණ වයසඇති පොල් ගස් 2ක්ද, අවුරුදු 8ක් පමණ වයස ඇති පොල්ගහක් සහ අවුරුදු 2ක් පමණ වයසඇති පොල්ගස් 2ක්ද ඇති වත්ත | අකුරැස්සේ පදිංචි හත්තොටුවේගමගේ ලවනිස් | 0 0 19·8 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ මැයි මස 5වෙනි දින පෙරවරු 11යේ කාලයට අකුරැස්සේ තානායමේදී "මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑම සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ අප්‍රෙල් මස 5වෙනි දින
මාතර කච්චේරියේදීය.

ඇම්. රාජපක්ෂ,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා.


PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.

171——J. N. 82833—149 (4/39)
S 1